නුඹලා කිසිවකුගේ පානය තුළට මැස්සෙකු වැටුණු විට ඔහු එය එහි ගිල්වා පසුව එය ඉවත් කළ යුතු වේ. හේතුව සැබැවින්ම උගේ පියාපත් දෙකින් එකක රෝගය සහ අනෙකෙහි ප්රතිකාරය ඇති බැවිනි.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “නුඹලා කිසිවකුගේ පානය තුළට මැස්සෙකු වැටුණු විට ඔහු එය එහි ගිල්වා පසුව
එය ඉවත් කළ යුතු වේ. හේතුව සැබැවින්ම උගේ පියාපත් දෙකින් එකක රෝගය සහ අනෙකෙහි ප්රතිකාරය ඇති බැවිනි.” තවත් වාර්තාවක “සැබැවින්ම එහි රෝගය ඇති උගේ පියාපතින් සැබැවින්ම එය ආරක්ෂාව සළසයි.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද්
එය වාර්තා කර ඇත]

පානයක මැස්සෙකු වැටුණු විටෙක සම්පූර්ණයෙන්ම එහි එය ගිල්වීමෙන් බලපෑමක් ඇති නොවන බවට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියි. එය උගේ පියාපත් දෙකින් එකක රෝගයත්. -එනම් ජලයේ ගිලී ඇති පියාපතයි.- අනෙකෙහි එහි රෝග කාරකයත් තිබෙන බැවිණි. සතවර්ෂ ගණනාවකට පෙර මුස්ලිම්වරුන් දැන සිටි මෙම ප්රතිකාරය නවීන වෛද්යවරු විසින් සනාථ කර ඇත. ඉස්ලාමයේ ආශිර්වාදය මත පිහිටීම සඳහා සියලු ප්රශංසා අල්ලාහ් දෙවිඳාණන්ටම සතු වන්නේය.

https://sunnah.global/hadeeth/si/show/8363